# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2443/57 - 2025 ජූලි මස 04 වැනි සිකුරාදා - 2025.07.04

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව**
**නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනය සඳහා අද්මිනිස්ත්‍රාසිකරුවකු පත්කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති බලතල අනුව, 2025.07.04 වැනි දින සිට බලාත්මක වන පරිදි, එදින සිට මාස 6ක කාලයක් සඳහා, නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්. සී. ආයතනයේ අද්මිනිස්ත්‍රාසිකරු ලෙස පී.ඩබ්ලිව්.ඩී.එන්.ආර්. රොද්‍රිගු මහතා පත්කෙරේ.

නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ සියලුම වත්කම්, අයිතිවාසිකම්, ව්‍යාපාර සහ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් සියලු පාලනය අද්මිනිස්ත්‍රාසිකරු වෙත පැවරෙන අතර, අදාළ කාල සීමාව නිමවන තෙක් හෝ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවලට අනුකූල වන පරිදි, නියෝගය අහෝසි කරන හෝ දීර්ඝ කරන තෙක් ආයතනයේ නමින් හෝ ආයතනය වෙනුවෙන් අද්මිනිස්ත්‍රාසිකරු විසින් ව්‍යාපාර සහ කටයුතු අඛණ්ඩ ව සිදුකළ යුතු ය.

එම පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාර ව, පත්වීම බලාත්මක වූ දින සිට දින 30ක් ඇතුළත හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කළ වෙනත් කාල සීමාවක් ඇතුළත අද්මිනිස්ත්‍රාසිකරු විසින් නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ සියලුම වත්කම් සහ වගකීම් පිළිබඳ ලේඛනයක් සකසා ඉදිරිපත් කළ යුතු ය.

තව ද, එම පනතේ 21 වැනි වගන්තිය ප්‍රකාර ව, අද්මිනිස්ත්‍රාසිකරු විසින් පත්වීම බලාත්මක වූ දින සිට දින 60ක් ඇතුළත නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනය සඳහා යෝජනා කරන වඩාත් ශක්‍ය නිරාකරණය කිරීමේ විකල්ප පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඊට අමතරව, අද්මිනිස්ත්‍රාසිකරු විසින්, නිරාකරණය කිරීමට යටත් නේෂන් ලංකා ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනයේ මූල්‍ය තත්ත්වය, අද්මිනිස්ත්‍රාසිකරුගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට අදාළ තොරතුරු සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර ඉල්ලීම් කරනු ලබන වෙනත් කරුණුවලට අදාළ තොරතුරු ඇතුළත් විධිමත් වාර්තාවන් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,**
පාලක මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකු අධිපති.

EOG 07 - 0046


1A - PG 7187 — 24 (2025/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*